**PAUL RATNAYEKE ASSOCIATES**
ATTORNEYS-AT-LAW
COLOMBO

**කොළඹ දිසා අධිකරණයේදීය.**

නිහාල් ශ්‍රී අමරසේකර,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

**පැමිණිලිකරු**

නඩු අංකය:21819/MR - එදිරිව -

1. ගාමිණි ලක්ෂ්මන් පීරිස්,
**විසුම්පාය,** ස්ටෙපල්ස් වීදිය, කොළඹ 02.
සහ කිරුළ පෙදෙස, කොළඹ 05.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කලම්බු හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස් බාරේ,
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 01.

**විත්තිකරුවෝ.**

වර්ෂ 1999 ක්වූ පෙබරවාරි මස 16 වන දිනදීය.

1. පැමිණිල්ල ප්‍රමාද දෝෂයකින් (per incuriam) භාරගෙන ඇති බව ද වෙනත් හේතු අතර වූ පහත දැක්වෙන හේතු නිසා පැමිණිල්ල ප්‍රතික්ෂේප කලයුතු බව සහ/හෝ නඩුව නිශ්ප්‍රභා කලයුතු බව අපි ගරු අධිකරණයට දන්වා සිටිමු.

   (අ) වෙනත් හේතු අතර වූ පහත දැක්වෙන හේතු නිසා පැමිණිල්ලෙන් නඩු නිමිත්තක් අනාවරණය නොවේ.
   - (i) පැමිණිල්ලෙන් මුහුණත අනුව ව්‍යුත්පන්න නඩුවක් අනාවරණය නොවේ,
   - (ii) කෙසේ වුවද, පැමිණිල්ලේ දක්වා ඇති කරුණු මත හොටෙල් ඩිවලෝපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමට නඩුවක් නොමැති වන්නට තිබුණි.

   (ආ) පැමිණිලිකරුගේ උද්දේශිත හිමිකම්පෑම සහ/හෝ උද්දේශිත නඩු නිමිත්ත පැමිණිල්ලේ මුහුණත අනුව කාලාපගමනය වී ඇත.

   (ඇ) මුහුණත අනුව, විත්තිකරුගේ පෞද්ගලික තත්ත්වයෙන් ඔහුට විරුද්ධව හිමිකම පෑමක් සහ/හෝ සහනයක් නැත.

2. ඉහත කී අවස්ථාගත කරුණු අනුව පැමිණිල්ල ප්‍රතික්ෂේප කරන ලෙස සහ/හෝ නඩුව නිශප්‍රභා කරන ලෙස අපි ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිමු.

මෙම මෝසමේ කරුණු තහවුරු කිරම සඳහා වර්ෂ 1999 පෙබරවාර 19 වන දින ගරු අධිකරණයේ මෙම නඩුව කැඳවන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

Sgd. Paul Ratnayeke Associates

**1වන විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරු.**

මෙහි පිටපතක් සීඝ්‍රගාමී ලියාපදිංචි තැපැලෙන් හා අතින් පැමිණිලිකරුගේ
සහ දෙවන විත්තිකරුගේ ලේඛනගත නීතිඥවරුන් වෙත යවා ලියාපදිංචි
තැපැල් කුවිතාන්සිය මේ සමග ඉදිරිපත් කරමු.

Sgd. Paul Ratnayeke Associates

**1වන විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරු.**